# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2253/63 - 2021 නොවැම්බර් මස 13 වැනි සෙනසුරාදා - 2021.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාව - පළමුවන සංශෝධනය

2020 ජූලි මස 06 දිනැති හා අංක 2183/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 නොවැම්බර් මස 10 වැනි දින.

**7.2.4. හි,**

I. විදුලි, ලෝහ වැඩ, ලී වැඩ, ගොඩනැගිලි, කාර්මික චිත්‍ර, මෝටර් යාන්ත්‍රික, ස්වර්ණාභරණ, ශීතකරණ හා වායුසමීකරණය, ඉලෙක්ට්‍රොනික් සහ ලඝුලේඛනය හා යතුරු ලියනය යන වෘත්තීය ක්ෂේත්‍රවල උපදේශක තනතුරු හා කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාගයක් හා වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවාගනු ලැබේ.

IV. ඉහත අංක 1 හි සඳහන් ක්ෂේත්‍රවලට අයත් නොවන තොරතුරු තාක්ෂණය, විද්‍යා/ගණිත, වාණිජ, කෘෂිකර්මය හා ඉංග්‍රීසි යන වෘත්තීය ක්ෂේත්‍රවල උපදේශක තනතුරු හා කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත පමණක් බඳවාගනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අභියෝග්‍යතාවය, සාමාන්‍ය දැනීම, ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු සඳහා පිළිවෙලින් 1:1:1 අනුපාතයට බරතැබීම මත ලිඛිත විභාගයට හා ප්‍රායෝගික පරීක්ෂණයට වෙන වෙනම ලකුණු 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙළින් ලැයිස්තුගත කර විභාග කොමසාරිස් ජනරාල් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

1A - G 35323 — 15 (2021/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**7.2.4.3 ප්‍රායෝගික පරීක්ෂණය :**

අයදුම්කරු සතු ඉගැන්වීම පිළිබඳ හැකියාව ඇගයීම සඳහා මෙම පරීක්ෂණය පවත්වනු ලබන අතර මේ සඳහා ලකුණු 25ක් ලබාදෙනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ විස්තර "ඊ" පරිශිෂ්ඨයෙහි ඇතුළත් වේ.

7.2.4.3.1 ප්‍රායෝගික පරීක්ෂණය පවත්වන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන පරීක්ෂණ මණ්ඩලයක්

**7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන බඳවා ගැනීමේ *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**7.3.4. හි,**

I. විදුලි, ලෝහ වැඩ, ලී වැඩ, ගොඩනැගිලි, කාර්මික චිත්‍ර, මෝටර් යාන්ත්‍රික, ස්වර්ණාභරණ, ශීතකරණ හා වායුසමීකරණය, ඉලෙක්ට්‍රොනික් සහ ලඝුලේඛනය හා යතුරු ලියනය යන වෘත්තීය ක්ෂේත්‍රවල උපදේශක තනතුරු හා කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාගයක් හා වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවාගනු ලැබේ.

IV. ඉහත අංක I හි සඳහන් ක්ෂේත්‍රවලට අයත් නොවන තොරතුරු තාක්ෂණය, විද්‍යා/ගණිත, වාණිජ, කෘෂිකර්මය හා ඉංග්‍රීසි යන වෘත්තීය ක්ෂේත්‍රවල උපදේශක තනතුරු සහ කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත පමණක් බඳවාගනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අභියෝග්‍යතාවය, සාමාන්‍ය දැනීම, ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු සඳහා පිළිවෙලින් 1:1:1 අනුපාතයට බරතැබීම මත ලිඛිත විභාගයට හා ප්‍රායෝගික පරීක්ෂණයට වෙන වෙනම ලකුණු 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙළින් ලැයිස්තුගත කර විභාග කොමසාරිස් ජනරාල් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**7.3.4.3 ප්‍රායෝගික පරීක්ෂණය :**

අයදුම්කරු සතු ඉගැන්වීම පිළිබඳ හැකියාව ඇගයීම සඳහා මෙම පරීක්ෂණය පවත්වනු ලැබේ. මේ සඳහා ලකුණු 25ක් ලබාදෙනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ විස්තර "ඊ" පරිශිෂ්ඨයෙහි ඇතුළත් වේ.

7.3.4.3.1 ප්‍රායෝගික පරීක්ෂණය පවත්වන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන පරීක්ෂණ මණ්ඩලයක්

**7.3.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

**ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :**

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන බඳවා ගැනීමේ *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

7.3.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**10.3.1. සපුරාලිය යුතු සුදුසුකම් :**

I. "එ" පරිශිෂ්ඨයේ සඳහන් අදළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් ලෙස පිළිගත් ආයතනයකින් හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් පිරිනමනු ලබන මානව සම්පත් කළමනාකරණය/ව්‍යාපාර කළමනාකරණය/රාජ්‍ය කළමනාකරණය/මූල්‍ය කළමනාකරණය/සන්නිවේදනය/අධ්‍යාපන කළමනාකරණය/සමාජ විද්‍යාව/සමාජ වැඩ/ප්‍රජා සංවර්ධනය/අධ්‍යාපනය/සංවර්ධන අධ්‍යාපනය/සංවර්ධන ආර්ථික විද්‍යාව යන විෂයයන්ගෙන් කවර එකකට හෝ අයත් විෂය ක්ෂේත්‍රයකින් අවම වශයෙන් එක් අධ්‍යාපන වර්ෂයක අධ්‍යයන කටයුතු ඇතුළත් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**12.2 පුහුණුව හා සංවර්ධනය :**

12.2.1 III ශ්‍රේණියට බඳවා ගන්නා සියලුම නිලධාරීන් සේවාගත කිරීමට පෙර අවම වශයෙන් සති හතරක (04) (පැය 160ක) මූලික ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳ පුහුණු පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය. එහිදී පුහුණු කාලය අවසානයේ නිලධාරීන්ගේ ඉගැන්වීමේ හැකියාව ඇගයීමට ලක් කර සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

මෙම පුහුණුව විෂයභාර අමාත්‍යාංශයේ හෝ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන වෙනත් උසස් පුහුණු කිරීමේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක් මගින් පවත්වනු ලැබේ.

12.2.2 සේවයේ II ශ්‍රේණියේ සියලුම නිලධාරීන් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ආයතනික රෙගුලාසි, මුදල් රෙගුලාසි හා දේශීය සහ ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොල පිළිබඳ පැය 100ක පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කළයුතු අතර I ශ්‍රේණියට උසස් කිරීම සඳහා මෙම පුහුණු සහතිකය ලබා තිබිය යුතුය.

**"ආ" පරිශිෂ්ඨය**

මෙම පරිශිෂ්ඨයේ ඇතුළත් වගුවට පහතින් පහත සටහන ඇතුළත් කරනු ලැබේ.

**සටහන :** කථිකාචාර්ය හා උපදේශක යන තනතුරුවල අයදුම්කරුවන් විසින් අයදුම් කරන විෂය ක්ෂේත්‍රයට අදළ විෂයය, උපාධියේ හෝ වෘත්තීය පාඨමාලාවේ අධ්‍යයන සම්භාර ගණනෙන් 1/3ක්වත් ආවරණය කර තිබිය යුතුය.

**"ඇ" පරිශිෂ්ඨය**

මෙම පරිශිෂ්ඨයේ ඇතුළත් වගුවට පහතින් පහත සටහන ඇතුළත් කරනු ලැබේ.

**සටහන :** කථිකාචාර්ය හා උපදේශක යන තනතුරුවල අයදුම්කරුවන් විසින් අයදුම් කරන විෂය ක්ෂේත්‍රයට අදළ විෂයය, උපාධියේ හෝ වෘත්තීය පාඨමාලාවේ අධ්‍යයන සම්භාර ගණනෙන් 1/3ක්වත් ආවරණය කර තිබිය යුතුය.

**"ඉ" පරිශිෂ්ඨය**

01. විභාගයේ නම : ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන වෘත්තීය පරීක්ෂණය - (විවෘත/සීමිත)

02. විභාගය පිළිබඳ විස්තර :

| *පරීක්ෂණය* | *විෂය අංකය හා විෂය ක්ෂේත්‍රය* | | *කාලය* | *මුළු ලකුණු* |
|---|---|---|---|---|
| වෘත්තීය පරීක්ෂණය | 01. | ස්වයංචල තාක්ෂණය (මෝටර් රථ තාක්ෂණය) | උපරිම පැය 06 | 100 |
| | 02. | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | | |
| | 03. | ගොවිපල යන්ත්‍රෝපකරණ තාක්ෂණය | | |
| | 04. | ඉදිකිරීම් තාක්ෂණය | | |
| | 05. | ශීතකරණ හා වායුසමීකරණ තාක්ෂණය | | |
| | 06. | නිෂ්පාදන තාක්ෂණය | | |
| | 07. | ආහාර තාක්ෂණය | | |
| | 08. | ජෛව වෛද්‍ය ඉංජිනේරු තාක්ෂණය | | |
| | 09. | මෙකාට්‍රොනික් තාක්ෂණය | | |
| | 10. | වෑද්දුම් තාක්ෂණය | | |
| | 11. | විදුලි සංදේශ තාක්ෂණය | | |
| | 12. | විද්‍යුත් තාක්ෂණය | | |
| | 13. | ස්වර්ණාභරණ තාක්ෂණය | | |
| | 17. | ඉලෙක්ට්‍රොනික් | | |
| | 18. | ගොඩනැගිලි තාක්ෂණය | | |
| | 19. | මෝටර් යාන්ත්‍රික | | |
| | 20. | ලී වැඩ | | |
| | 21. | ශීතකරණ හා වායුසමීකරණ | | |
| | 22. | කාර්මික චිත්‍ර | | |
| | 23. | විදුලි | | |
| | 27. | ලෝහ වැඩ | | |
| | 28. | ලසුලේඛනය හා යතුරුලියනය | | |
| | 29. | ස්වර්ණාභරණ | | |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරන පරීක්ෂණ මණ්ඩලයක්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි

05. පරීක්ෂණයට අදාළවන වෘත්තීය ක්ෂේත්‍රයන් හා විෂය නිර්දේශය :

| විෂය අංකය හා විෂය ක්ෂේත්‍රය | | විෂය නිර්දේශය |
|---|---|---|
| 01. | ස්වයංචල තාක්ෂණය (මෝටර් රථ තාක්ෂණය) | මෙම වෘත්තීය පරීක්ෂණය තාක්ෂණ/කාර්මික විද්‍යාලයන්හි දැනට පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමේ (NVQ-5) පාඨමාලාවල ප්‍රායෝගික පරීක්ෂණයන්ට සමාන මට්ටමකින් පැවැත්වෙනු ඇත.<br><br>මෙහිදී අපේක්ෂකයා තම තාක්ෂණික දැනුම අදාළ යන්ත්‍ර යුත්‍ර ක්‍රියාකරවීමටත් මෙවලම් හඳුනා ගැනීමට හා පරිහරණය කිරීමටත් එම උපකරණ මෙවලම් භාවිතයෙන් සිසුනට තම ශිල්පීය දක්ෂතාවය ප්‍රදර්ශනය කර අවබෝධය ලබාදීමට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ. |
| 02. | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | |
| 03. | ගොවිපල යන්ත්‍රෝපකරණ තාක්ෂණය | |
| 04. | ඉදිකිරීම් තාක්ෂණය | |
| 05. | ශීතකරණ හා වායුසමීකරණ තාක්ෂණය | |
| 06. | නිෂ්පාදන තාක්ෂණය | |
| 07. | ආහාර තාක්ෂණය | |
| 08. | ජෛව වෛද්‍ය ඉංජිනේරු තාක්ෂණය | |
| 09. | මෙකාට්‍රොනික් තාක්ෂණය | |
| 10. | වෑද්දුම් තාක්ෂණය | |
| 11. | විදුලි සංදේශ තාක්ෂණය | |
| 12. | විද්‍යුත් තාක්ෂණය | |
| 13. | ස්වර්ණාභරණ තාක්ෂණය | |
| 17. | ඉලෙක්ට්‍රොනික් | |
| 18. | ගොඩනැගිලි තාක්ෂණය | |
| 19. | මෝටර් යාන්ත්‍රික | |
| 20. | ලී වැඩ | |
| 21. | ශීතකරණ හා වායුසමීකරණ | |
| 22. | කාර්මික චිත්‍ර | |
| 23. | විදුලි | |
| 27. | ලෝහ වැඩ | |
| 28. | ලඝුලේඛනය හා යතුරු ලියනය | |
| 29. | ස්වර්ණාභරණ | |

**"ඊ" පරිශිෂ්ඨය**

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ විස්තර (විවෘත/සීමිත) -

1 ප්‍රායෝගික පරීක්ෂණය :

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගත් තම විෂය ක්ෂේත්‍රයට අදාළ මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතු ය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| අනු. අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අරමුණ හා ප්‍රවිශ්ඨ වීම | 05 | 02 |
| 02. | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03. | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |

| අනු. අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 04. | කාල කළමනාකරණය | 05 | 02 |
| 05. | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

2 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය :

I. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි 5ක් ලබා දෙනු ලැබේ.

II. ප්‍රායෝගික පරීක්ෂණය ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.

III. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබාගත යුතු ය.

IV. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

3 නිර්ණායකයන්හි අරමුණ :

I. අරමුණ හා ප්‍රවිශ්ඨ වීම
සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ඨ වීමේ හැකියාව ඇගයීම.

II. පෞරුෂය හා හඬ පාලනය
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම.

III. සන්නිවේදනයේ පැහැදිලි බව
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

IV. කාල කළමනාකරණය
ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම.

V. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය
අරමුණ කෙරෙහි ළඟාවීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම.

සටහන :

දැනට පවතින "ඊ" පරිශිෂ්ඨය "උ" පරිශිෂ්ඨය ලෙසත්,
දැනට පවතින "උ" පරිශිෂ්ඨය "ඌ" පරිශිෂ්ඨය ලෙසත්,
දැනට පවතින "ඌ" පරිශිෂ්ඨය "එ" පරිශිෂ්ඨය ලෙසත් සංශෝධනය වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.